05

# සීතාවක රාජසිංහ රජු දුෂ්ට පිතෘ ඝාතක රජෙක් ද ?

**ඩබ්ලිව්.එම් හිරාන් මදුසංක .**

ඉතිහාසය අධ්‍යයනය සරලව අරුත් දක්වන්නේ නම් අතීතයේ සිදු වී ඇති සිදුවීම් සමුදාය, ඒ පිළිබඳ තතු දක්වන මූලාශ්‍රය මඟින් වත්මනේ සිට අධ්‍යයනය කිරීමයි. මේ මූලාශ්‍ර වර්ග බොහෝ වෙයි. ඒ අතර සාහිත්‍යමය මූලාශ්‍රයට හිමි වන්නේ ප්‍රධාන තැනකි. ඉතිහාසය අධ්‍යයනය කෙරෙනුයේ මිනිසා මූලික කරගෙන වුවත් වත්මනේදී අපට ඉතිහාසය අධ්‍යයනය කිරීමට ඇත්තේ මේකී මූලාශ්‍රය පමණකි. එනමුත් එම මූලාශ්‍රයේ තොරතුරු අනුව ඉතිහාසයේ දිශාව වෙනස් වෙයි. එසේම එකී මූලාශ්‍රය සඳහා බලපානු ලබන අභ්‍යන්තර බාහිර හෝ කුමන සාධක මතද එහි ගමන් මග වෙනස් වීමට ඉඩ ඇත. මූලාශ්‍රය රචකයාගේ රුචි අරුචිකම්ද සත්‍යයෙන් ඔබ්බට ගිය තොරතුරුද ඒ සඳහා ඇතුළත් වීමට ඉඩ ඇත. එහෙයින් පාඨකයාගේ හෝ පර්යේෂකයාගේ වගකීම වන්නේ බොහෝ සෙයින් අධ්‍යයනයේ යෙදී මනා පරීක්ෂාවෙන් හා ප්‍රවේශමෙන් අධ්‍යයනය කිරීමයි. නැතහොත් සිදු වන්නේ පසුකාලීන පාඨකයන් හෝ විවිධ වූ ක්ෂේත්‍රවල පුද්ගලයන් වෙනත් දිශාවකට ගමන් කිරීමයි. එසේම කුමන හෝ මූලාශ්‍රයක තොරතුරු එකහෙළා පිළිගැනීමමත් වඩා බොහෝ මූලාශ්‍රය අධ්‍යයනය කිරීමත් ඒ මතින් නිවැරදි නිගමන වලට එළඹීමේ ක්‍රමය වඩාත් උචිත බව දැක්විය යුතුය.

## හැඳින්වීම

වර්ෂ දෙදහස් පන්සියයකටත් එහා ගිය ඉතිහාසයකින් සපිරුණු ලංකාවේ එදා ඒ ඒ යුග වල ස්වර්ණමය පාලකයෝ වූහ. ඔවුන් සහ එම යුගයන් ඇතැම් හේතු මත තවමත් ලක් ඉතිහාසය තුළ බැබළෙයි. කතාවට බඳුන් වෙයි. වන්දනයට ද පාත්‍ර වෙයි. නමුත් ඒ වර්ෂ දෙදහස් පන්සියටත් එහාගිය අතීතයක් ඇති ඉතිහාසයේ මෑත කාලීන යුගයක් හා පාලකයෝ වූහ. ඔවුහු ද රට දැය නගනු වස් ක්‍රියා කළහ. දිවිහිමියෙන් තම ජීවිත කාලය පුරාවටම යුද කළහ. එවක් වනතෙක් රජුන් නොකළ අන්දමට යුධ පිටියේද පොර කොටා ගත්හ. නමුත් ඔවුන් පිළිබඳ එම යුග පිළිබඳ කථා කිරීමට ඇදහීමට, වන්දනා කිරීමට කිසිවෙක් නොවූහ. මන්ද යත් ඔවුන් හා එම යුග, සිදුවීම් පිළිබඳ දුර්මත ප්‍රචාරය වී තිබීමත් ඒවා ජනයා

වැළඳගෙන තිබීමත් ය. ලක් ඉතිහාසයේ එසේ අගතියට පත් වූවෝ බොහෝ වෙති. නමුත් සීතාවක රාජධානි සමයත් එහි මායාදුන්නේ, රාජසිංහ වැනි සුවිශේෂී පාලක චරිතත් ඉන් ප්‍රධානතම වේ. ඉතිහාසය තුළින් එම පාලකයෝ අගතියට අසාධාරණයට ලක්වූහ. යම් යම් අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වූ පුද්ගලයෝ තම රුචි අරුචිකම් අනුව පක්ෂග්‍රාහීකම් අනුව ඉතිහාස රචනයේ යෙදීම නිසා පසුකාලීන පාඨකයා මෙන්ම ඉතිහාස ගවේෂකයා එකී නිගමන සත්‍ය යැයි පිළිගැනීම සිදු විය. සත්‍ය සත්‍ය ලෙසින් දැකීමට ඉදිරිපත් කිරීමට නොහැකි වූ කල ඒ පිළිබඳ උනන්දු වූ පුද්ගලයෝ තමන්ට රුචි ලෙස ඉතිහාසය ලිවූහ. එහෙයින් සත්‍යයෙන් මෑත් වූ කරුණු සඳහා වටිනාකම් ලැබිණි. එහෙයින් වීරයෝ දුෂ්ටයෝ ලෙසින් නම් වූවාසේම වර්තමානය වන විටදී පවතින මතයන්ට එලෙසින් පදනම ලැබිණ.

ඉතිහාසය අධ්‍යනයට ඇත්තේ මූලාශ්‍රය පමණකි. සෑම මූලාශ්‍රයන් හෙළි කරන්නාවූ කොරතුරු කවරේද යත් ඒ පිළිබඳව විචක්ෂණශීලිව සොයා බලා සංසන්ඳනාත්මකව අධ්‍යයනයකර නිගමන වලට එළඹීම ඉතිහාසඥයාගේ වගකීම වෙයි.

## සීතාවක රාජසිංහ රජුට එල්ල වන පීතෘ ඝාතක චෝදනාවේ සත්‍යාසත්‍ය බව

කෝට්ටේ රාජධානියේ සවන පැරකුම්බාවන්ගෙන් පසුව පැහැදිලිවට පරිහාණිය කරා ගමන කිරීම අරඹා තිබුණි. එනම් ඊට පරව බලවත් හෝ ප්‍රබල පාලකයතකු බිහි නොවූ අතර පසු කල් වෙත්ම කුඩා කාල සීමාවන් තුල පාලකයන් කිහිප දෙනෙක් බිහිවීමත් අස්ථාවර රාජ්‍ය පාලන තත්ත්වන්ද දැක ගත හැකිවෙන්නේ ද මේ කාලයේදීමය. අවසානයේදී සත්වන විජයබාහු රජුගේ කාලයේදී රාජ උරුමය ඇති පුතුන්ගෙන් පිට එනම් තමන්ගේ දෙවන විවාහයේ දරුවකුට රජකම ලබාදීමට ගත් උත්සාහය නිසා මේ නිල උරුමය ලත් පුතුන් වූ බුවනෙකබාහු මායාදුන්නේ හා රයිගම්බණ්ඩාරයන් විසින් තම පියා මරා කෝට්ටේ රාජධානිය කොටස් වලට බෙදා ගනී. බුවනෙකබාහු කුමාරයා කෝට්ටේත් රයිගම් බණ්ඩාර විසින් රයිගමත් තම රාජ්‍යයන් කරගන්නා අතර මායාදුන්නේ විසින් සීතාවක පිහිටුවා ගනී. කුඩා කල සිටම

පෘතුගීසි විරෝධි ආකල්ප දරණ මායාදුන්නේ විසින් සීතාවක සිට තම සටන් ඉදිරියට ගෙන යනු ලබයි.

මේ මායාදුන්නේගේ පුතා වන්නේ ටිකිරි රජ්ජුරු බණ්ඩාර හෙවත් සීතාවක රාජසිංහයි. මේ දෙදෙනා එක්ව වර්ෂ ගණනාවක් පුරාවටම තමන්ගේ ඒකායන අභිලාෂය වන පෘතුගීසින් මෙරටින් පන්නා දැමීමේ ව්‍යාපාරයේ නිරත වෙයි. මායාදුන්නේ විසින් තම රාජ්‍ය කාලය තුළ දී ගෙන යන්නාවූ මේ ව්‍යාපාරය ඔහුගේ මරණයෙන් පසුව සීතාවක රාජසිංහ විසින් ඉදිරියට ගෙන යයි. මායාදුන්නේ මිය යන්නේ ක්‍රිව 1581 දී පමණය. එහෙත් ඊට පෙරදී තමා මහලු හෙයින් තම පුතු හට රාජ්‍ය සියලු බලතල සහිතව පවරා දුන් වග මූලාශ්‍රයේ සඳහන් වේ. එසේම මායාදුන්නේ මිය යන්නේ ස්වභාවිකව බවත් එම මූලාශ්‍රය වලින් පෙනේ නමුත් ඉතිහාසයේ ලියැවී ඇති හා ඉතිහාසයේ සඳහන් වන්නේ ටිකිරි බණ්ඩාර විසින් මායාදුන්නේ පිය රජුව රාජ්‍ය ලෝභයෙන් මරා දමන ලද බවකි. නැතහොත් පියාගෙන් රාජ්‍යය උදුරා ගැනීමට පියා මැරූ බවකි. ලාංකීය ඉතිහාසය තුල බොහෝ සෙයින් මතභේදයට හේතු වී ඇති කරුණක් වන මෙම කරුණ පිළිබඳව විමර්ෂණශීලිව අධ්‍යයන කළ යුතුය පර්යේෂකයාගේ කාර්යය නම් විමර්ෂණශීලිව අපක්ෂපාතීව පරීක්ෂා කර බලා ඉතිහාසයේ ගැටලු සහගත තැන් නිවැරදි කිරීමයි. රාජසිංහයින් පිතෘ ඝාතකයෙක් යැයි යන්න දක්වන්නේ නම් මහාවංසය පමණකි. කෙසේ නමුත් එය එසේ නොවේ යයි ඒත්තු ගැන්වීමට ඔප්පු කිරීමට ද තොරතුරු බොහෝ හමුවේ.

මේ කරුණ පිළිබඳව මෙන්ම මේ කාල සීමාව පිළිබඳව අධයයනය කිරීමට ඇති මූලාශ්‍රය අල්පයකි. ඒ අතර දේශීය මෙන්ම විදේශීය මූලාශ්‍ර ද වෙයි.මහාවංසය, සුළු රාජාවලියට අලකේශ්වර යුද්ධය, සීතාවක හටන, රාජාවලිය, සැවුල් සංදේශය, මන්දාරම්පුර පුවත යනාදී දේශීය ප්‍රාථමික මූලාශ්‍රයද පෘතුගීසි ජාතික වාර්තාකරුවකු වන ෆර්නාඕ ක්වේරෝස් පූජකතුමාගේ ග්‍රන්ථය දියෝගු ද කුටෝ ජාඕ රිබෙයිරෝ සහ බැල්දියස්ගේ ලංකා පුරාවෘත්තය යනාදී කෘති ප්‍රමුඛ වෙයි. මෙසේම තවත් බොහෝ ද්විතියික මූලාශ්‍රයද මේ පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීමට මහෝපකාරී වෙයි.

රාජසිංහයින් පිතෘ ඝාතකයෙක් යැයි දක්වන මහාවංසයට (සුළු රාජාවලියටද)අනුව මායාදුනු රජුගේ මරණය වනාහි රාජ්‍යලෝභයෙන්

කල්යැවූ ස්වකීය පුත්‍ර ටිකිරි බණ්ඩාරගේ දේහානුඥණෙයෙන් සිද්ධ කරන ලදැයි සාමාන්‍ය මතය විය, යනුවෙන් මහාවංසය දක්වයි. (මහාවංසය,පි508) මහාවංසය මෙසේ කියන්නේ ඇයිද යන්න මුලින්ම සොයා බැලිය යුතු කරුණකි. මන්ද වෙනත් කිසිදු දේශිය හෝ විදේශිය මූලාශ්‍රයක් වේවා එවැන්නක් ගැන සඳහන් නොකරයි. ඍජුවම කිවහොත් පරංගීන්ට පහර පිට පහර එල්ල කල ඔවුන්ගේ පරම හතුරා වූ රාජසිංහ ගැන පෘතුගීසි ලේඛකයින්ද එසේ නොකියයි. ඒ සඳහා හේතු වන්නේ උඩරට විසූ හිමිවරු හා රදළ ප්‍රභූන්ය රාජසිංහගේ අවසාන කාලයේදී රාජසිංහට එරෙහිව කුමන්ත්‍රණයක් ගෙන යාමයි. එ කුමක්ද නම් රාජ්‍යත්වය උඩරට වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොණප්පු බණ්ඩාරයන්ට ලබාදීමට ගත් උත්සාහයයි. මේ කුමන්ත්‍රණය සඳහා හවුල් වන්නේ දෙවනගල රතනාලංකාර හිමිත් (සාහිත්‍ය,1964,3කලාපය)ගම්පොල ධර්මකීර්ති (අමරසිංහ,1998,පි167) යන හිමිවරුන්ය. පේරාදෙණි රජ පෙළපතින් පැවත එන කොණප්පු බණ්ඩාරගේ පියාවූ වීරසුන්දර බණ්ඩාරව රාජසිංහ රජු විසින් මරවන්නේ උඩරට අවුල් කලා යයි චෝදනා නගමින් ගොලෑබොක්කේදී බොරුවලක දැමීමෙනි. මෙයින් තම දිවියත් අනතුරේ බව වටහා ගත් ඔහු පුත් කොනප්පු බණ්ඩාර වහා ආරක්ෂාව පතා පෘතුගීසින් වෙත පළා යයි.පසුව ගෝව දක්වා යන මොහු පෘතුගීසින් ඇසුරේ සිට ශිල්ප ශාස්ත්‍ර පුහුණුව ලබයි. රාජ උරුමය ඇති මොහු හට රජකම ලබාදීමට පෙර ඔහු ජනප්‍රසාදයට ලක් කිරීමටත් ඔහුගේ දේශීය උරුමය නැවත මතුකරලීමටත් මහජනතාවගේ සම්බන්ධීකාරකයන් ලෙස කටයුතු කිරීමට මුල් වන්නේ උක්ත කී හිමිවරුන්ය. එහෙයින් උන්වහන්සේලාගේ උත්සාහය වන්නේ යුද්ධයෙන් පරාජය කිරීමට අපහසු සීතාවක රජුව මහජනයාගේ සිත් තුළින් පරාජය කිරීමයි. ඒ සඳහා ගන්නා ලද උත්සාහික මිත්‍යා කථාව නම් රාජසිංහ විසින් පියා මරවා සීතාවක සිහසුන උරුම කරගත් බවයි. මේ ආරංචිය රට පුරා ප්‍රචලිත කිරීමට මුල් වන්නේ මේ හිමිවරුන්මය. ලාංකීය ඉතිහාසයේ පිතෘ ඝාතක රජුන්ට ඇති තත්ත්වය කෙබඳුදැයි අපි දනිමු. එහෙයින් මහජනයාගේ සිත් රජු කෙරේ බිඳී ගියා සේම කොණප්පු බණ්ඩාර කෙරේ වැසියා එක් රොක් වීමටද පටන් ගති. මේත් සමග ක්‍රි.ව 1592 දී බලන අසළදී රාජසිංහ හා කොනප්පු බණ්ඩාර අතර සිදුවන සටනදී රාජසිංහයන්ට පසු බැසීමට වූ අතර පෙතංගොඩ උයනේදී ඇණුන උණ කටුව හේතුවෙන් එතුමාට මරණය ළඟා විය. මේ සමඟම කොණප්පු බණ්ඩාර පලමුවන විමළධර්මසූරිය ලෙසින් උඩරට රාජ්‍යත්වයට පත්වේ. කොණප්පු

බණ්ඩාරට මෙසේ උඩරට රජවීමට පසුබිම සකසන උක්ත කී හිමිවරුන් ඒ සඳහා රාජසිංයහන් කෙරේ ජනතාව බිඳවීමට යොදා ගන්නේ එතුමාහට පිතෘ ඝාතක චෝදනාවක් නගමිනි. එහෙයින් සීතාවක රාජසිංහ පිතෘ ඝාතක රජෙක්ය යන්න සත්‍යක් ලෙසින් පිළිගැනීම අපහසුය.

ජනශ්‍රැතිගත කථාවලට අනුව නම් මායාදුන්නේගේ පුතා වන්නේ ටිකිරි කුමාරයා හෙවත් සීතාවක රාජසිංහය. මායාදුන්නේ හා බිසවට බොහෝ කල් යන තෙක් දරු සම්පත් නොතිබූ බවත් දිවයිනේ බොහෝ වෙහෙර විහාර වල දේවාල වල භාර හාර වූ බවත් සඳහන්ය. එසේම පසු කාලයේදී බිසවගේ දිගු කෙස් වැටිය කපා ඒ මඟින් කතරගම දේවාලයේ දේවාල භූමිය ඇමදීමෙන් වූ භාරයෙන් පසුව දේවියට කතරගම දෙවියන් සිහිනෙන් පෙණුන අතර කලක් ගිය තැන බිසවට දරු සම්පත් පහළ විය. ඒ අනුව බිහිවන කුමරා වන්නේ මේ ටිකිරි කුමාරයා හෙවත් සීතාවක රාජසිංහ රජුය. (රණසිංහ,ඩී.ඞී, 1998, පි69) මෙය සත්‍යයක් ලෙසින් මොහොතක් සිතුවහොත් මායාදුන්නේගේ එකම පුතා වන්නේ ටිකිරි ක--ුමරායි. එසේ නම් රජකම උදෙසා ඔහුට කිසිවිටකත් පියා මැරීමට අවශ්‍ය නොවි. මන්ද අනාගත සීතාවක සිහසුනට එකම උරුමකරුවා තමා වන බැවිනි. නමුත් රාජාවලිය අලකේශ්වර යුද්ධය හා වෙන්ත් මූලාශ්‍ර හා ගත් කළ මෙය තරමක් ගැටලු සහගත තත්ත්වයක් පෙන්නුම් කරයි.

එසේම ටිකිරි කුමාරයා කුඩා කල සිටම බොහෝ යුද්ධ වල නියැලී ඒ සියල්ලක්ම ජයග්‍රහණ කර සියලු ජනයාගේද ප්‍රසාදය දිනා සිටියේ තමා අනාගත සීතාවක රාජ්‍යයේ උරුමකරුවා බව පෙන්වමිනි. වේඩය බණ්ඩාරයන් හා කළ සටන් වලදී ඔහුව පරදවන ලද්දේය. ඒ එතෙක් වේඩය බණ්ඩාර හා අවිගටා ජයගන්නට කෙනෙක් ලක්දිව නැතැයි යන මතයට අභියෝග කරමිනි පැළෑඳේදී අලුත්නුවරදී ඒ බව මනාව ඔප්පු වූ අවස්ථාවන්ය. මේ ආදී වූ සිදුවීම්ද නිසා ඔහු සිහසුනට උරුමකරුවා ලෙසින් නම් වීම පුදුමයට කරුණක් ද නොවේ. නමුත් මෙහිදී වැඩමහල් කුමරුවන්ගෙන් විරෝධතාවන් එල්ල වූ බවක් ද කිසිඳු විටෙක කිසිඳු තැනෙක සඳහන් නොවේ. එසේ නම් ඔහුට රාජ්‍යත්වය කෙරේ දෙගිඩියාවක් ඇතිකර ගැනීමට කිසිඳු විටෙක අවශ්‍ය නොවේ.

"රාජාවලියට අනුව මායාදුන්නේ මහරජ අවුරුදු හැත්තෑවක් රාජ්‍යය කොට කලුරිය කළාහ", යනුවෙන් සඳහන් වේ. එනම් මායාදුන්නේ රජු ස්වභාවිකව මිය ගිය බවකි. එනම් රාජසිංහ විසින් දෙවන වර කොටුව වටලා එය අසාර්ථක වී ආපසු එන ගමනේදී තම පිය රජුගේ මරණය සැලවූ බවකි. (රාජාවලිය,1997,පි236)මේ යුගයට බොහෝ සෙයින් සමකාලීන වන කාලයක ලියැවෙන රාජාවලිය පවසන තතු නිවැරදි යැයි සිතිය හැකිය.එහිම දැක්වෙන්නේ තමාගේ ශ්‍රී රාජසිංහ කුමාරයින්ට තමාගේ අණ පණතින් පවතින හැටියට අවසර දුන් බවත්ය. එසේ නම් රාජ්‍ය උරුමය කෙරේ අවිශ්වාසයක් කුමාරයාට නොමැත. එහෙයින් මේ අවස්ථාව පිළිගැනීම සාවද්‍ය නොවේ.මෙසේම මායාදුනු රජුගේ මරණය සබැඳිව අලකේශ්වර යුද්ධයේ කතුවරයා නිහඬ වෙයි. නමුත් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුරැකෙන විත්ති පොතක් මායාදුනු රජුගේ මරණය පිළිබඳව දක්වන්නේද රාජාවලිය සීතාවක හටනට සමානම වූ තොරතුරුය. ''ශකවසින් එක්වා දහස් පන්සීය තුන්වැනි වර්ෂයේ දී නිකිණි මස පුර දොළොස්වක ලත් රිවිදින මායාදුනු මහරජ කළුරිය කළහ'' යනුවෙනි. (විත්ති පොත, ශ්‍රී.ලං.රා.ලේ,5/63/31/1) මෙහිද ඝාතනයක් පිළිබඳව යමක් නොකියවේ. සීතාවක හටන ග්‍රන්ථය නම් මෙම සීතාවක යුගයට සමකාලීනවම ලියවුණු හටන් කාව්‍ය ග්‍රන්ථයකි. මෙහි කෝට්ටේ යුගයේ සිට සීතාවක අවසානය දක්වාත් මහනුවර යුගයේ තොරතුරුත් මනාසේ විස්තර කොට ඇත. රාජසිංහ පිළිබඳවත් ඔහුගේ යුද කටයුතු පිළිබඳවත් පුද්ගලික තොරතුරුත් බොහෝ සෙයින් මෙහි අඩංගු වනවා සේම මේ යුගය පිළිබඳව තතු දැන ගත හැකි හා ප්‍රධානම මූලාශ්‍රය ද මෙය වෙයි. මීට අනුවද රාජසිංහ පිතෘ ඝාතකයෙක් බව හෙළි නොවේ. මෙහි දක්වන්නේ මායාදුනු රජු තමන්ගේ වයස්ගත බව නිසා රජකම අත්හල බවකි පුතුට රජකම පැවරූ බවකි.

මායා සෙනෙහෙ පිය රජ තම කුමරු හට
දයා සිතින් ගෙන්නා රජු වෙත සිට
නොයා මතක් වෙයි ලක්දිව සත හට
කියා නිරිඳු රජ සිරි බාර කර රාජසිංහ කුම රුට

පැළඳවමින් නිති රජ අබරණ ගෙ න
දුලද මිණි ඔටුනු සිරසේ පළඳමි න
සලද රන් කඩුව සුරතට දී එදි න
පැළඳ සිංහසුන් පිට රජ සිටුවමි න

(සීතාවක හටන"1999පි'149)

රාජසිංහ රජකම උදෙසා පිතෘ ඝාතකයෙක් විය, යන්න සාවද්‍ය කරුණක්ය කීමට මෙය කදිම නිදසුනකි.

එසේ නම් රාජසිංහයන් මිනීමරුවකු නම් තම කෘතිවල එය ඇතුළත් නොකළේ මන්දැයි රාජාවලි, සීතාවක හටන් කතුවරුන්ගෙන් ප්‍රශ්න කළ යුතුය. කොටින්ම කිවහොත් උඩරටට පක්ෂව උඩරට භික්ෂුණට පක්ෂව ලියුවුණු අස්ගිරි තල්පත ද රාජසිංහයන් පිතෘඝාතකයකු බව නොපවසයි. එවැන්නක් වුණි නම් රාජ්‍යද්‍රෝහී ක්‍රියා සිදුකළ භික්ෂූන්ට හිරිහැර කළා වූ රාජසිංහයිනට පහර ගැසීමට අපූර්ව අවස්ථාවක් ලෙසින් සලකා මෙය අස්ගිරි තල්පත්කරු තම කෘතියට ඇතුල් කරනවාමය. තවද මේ පසුබිමින්ම ලියැවෙන මන්දාරම් පුවතද රාජසිංහ රජු මිනීමරුවකු බව නොපවසයි. එසේම මන්දාරම් පුවත් කරු "බික් සඟුන් මරමින - නළල අළුගැය මිසදිටු ගෙන" නමින් රාජසිංහයන්ගේ මර්දනකාරී බව සඳහන් කළත් පිතෘ ඝාතකයෙකු බව සඳහන් නොකරයි. එය එසේ වුණි නම් තමන්ගේ සතුරන් වූ සීතාවකයන් ගැන සත්‍ය නොදැක්වීම විස්මයට කරුණක්මය.

සමකාලීන දේශීය මූලාශ්‍ර මෙසේ පවසත්දී විදේශීය මූලාශ්‍රයක් වන කුතෝ පවසන්නේ මෙවැන්නකි. "නවවෙනි දශකය පමණ විට රජු තම පිය වූ මායාදුන්නේ ගැන තරහෙන් තීරණ ගනුයේ ඔහු මරා රජවීමටය. එනම් බලකොටු අල්වා ගැනීමටය."රාජසිංහයන් පියාගේ ප්‍රධාන කපිතාන් ලෙස සිටියද අණ දීමේ හැකියාව තිබුණද නීත්‍යානුකූල සොයුරන් සිටි හෙයින් ඔවුන්ද රජයේ අයිතිකරුවන් වීමයි. එනම් පියා රාජ්‍යය ලබාදෙන්නේ උරුමකරුවාටය. එනම් පියා ජීවත්වීම තමන්ට අවාසි සහගතය. තර්ජනයකි. ඒ නිසා ඔහු අධිෂ්ඨාන කළේ තම පියා මැරීමටත් සොයුරන් තමන් යටතට ගෙන එම විශ්වාසවන්තයින් හා එක්වී ඔවුන්ට වසදීමටත් ක්‍රියාකරන ලද බවය.'' (Barros,1943,P271) මෙහි දී විමසිය යුතු කරුණකි. එනම් රාජසිංහයන් හට සොයුරන් තිදෙනෙක් බව දනිමු. ඔවුහු කවරහුද යන්න උක්ත සඳහන් කරන ලදී. මේ අවස්ථාව සඳහා රිසිමන් අමරසිංහ මහතාගේ ඓතිහාසික සීතාවක ග්‍රන්ථය උපයෝගී කරගත හොත් ඊට අනුව නම්, මහරජ්ජුරු බණ්ඩාර කුඩා කලදීම උකුත් වූයේය. සන්තාන බණ්ඩාර බකල හෙයින් රජකමට නුසුදුසු බව එම කෘතිය දක්වයි. (අමරසිංහ, 1990,පි40) තවද ඊට අනුව වීදිය බණ්ඩාර විසින් බත්ගමයකු ලවා

හදිකරවා තිඹිරිපොල කුමරු මරවන ලදී. (අමරසිංහ, 1990,පි40) එසේනම් ඒ වීදියේ බණ්ඩාර ජීවත්ව සිටින කාලයේ දී ය. එනම් ක්‍රි.ව. 1560 ට පෙරාතුවය. නමුත් මේ වන විටදී (1580 පමණදී) එසේනම් රාජ්‍යයට තරඟකරුවන් නොසිටිය යුතුය. ඒ නිසාම මායාදුන්නේ තම පුත්‍රයා හට බලය, රාජ්‍යය පවරා දුන් බව සිතීම සාධාරණය. කුතෝ පවසන පරිදි සොයුරන්ට වසදීමට රාජසිංහයන්ට අවශ්‍යතාවයක් නොවුණි. එසේ නොවුනත් එනම් මායාදුන්නේ මිය යාමට පෙර සියලුම සොයුරන් ජීවත් වෙමින් සිටියද රාජ්‍යයට උරුම කරුවා ලෙසින් නිල නොලත් තැනැත්තා වූයේද රාජසිංහමය. කිසිඳු තැනක තම සොයුරන් සමඟින් රාජසිංහයින් ගැටුණු බවක් ද සඳහන් නොවේ.

මේ අනුව අවධානය යොමු කළ යුතු ප්‍රධානතම කරුණක් වන්නේ මහාවංසය, සුළු රාජාවලිය හැර වෙනත් දේශීය මූලාශ්‍රයක රාජසිංහ රජු පීතෘ ඝාතකයකුයයි හෝ සහෝදරයෝ මරාදැමිනයි සඳහන් නොවීමයි. එසේ පවසන්නෝ විදේශීය මූලාශ්‍රයකරුවෝය. දේශීය මූලාශ්‍ර බොහොමයක්ම ලියවුනේ මේ කාලයට සමගාමීව එනම් රජුගේ කාලයට තත්කාලීනවයි. නැතහොත් ඊට වර්ෂ කීපයක් පසුවීමෙනි. එහෙයින් ඒවා සත්‍ය තොරතුරු දක්වතියි විශ්වාස කළ හැකිය. නමුත් ඒවා ලියවෙන කලදී දේශීය සතුරන් විසින් රජුට එරෙහිව පතලකළ දූෂමාන ආරංචි, කටකතා ජනයා අතරට නොගිය බවද සිතීම සාධාරණය. එනමුත් ඊට වර්ෂ ගණනාවකට පසුව ලියවෙන ක්වේරෝස් Conqeista Temporal da ceylao... සහ කුටෝගේ The History of Ceylon...(හේවාවසම්,2008,පි.5) ග්‍රන්ථ වලට එම ආරංචි වැදගත්ම ඒවා ලෙසින් එදා සමාජයේ පැතිරී තිබීමද ඔවුන් ඒවා එම සමාජයෙන් ලබාගෙන තම කෘතිවලට ඇතුල් කිරීම සිදු කළේ නම් ඔවුන්ගේ තොරතුරු ගැන දෙවරක් සිතීම වරදක් නොවන වග දත යුතුමය. එසේම සත්‍ය කුමක් වුවද රාජසිංහ ඝාතකයාය, සොයුරන් මරා දැමූ දුෂ්ටයාය, යනුවෙන් සඳහන් කරනුයේ තමන්ට පෙරදිග දුෂ්ට පරාජයක් හිමිකර දී වෂී ගණනාවක් තමන් හා සටන් වැද පෘතුගීසීන්ට මහත් වේදනාවක් සපයන ලද්දෙකුට එරෙහිව හඬ නැගීමට විය හැකිය. රාජසිංහ පෘතුගීසීන්ට මුහුණදීමට සිදුවූ බලවත්ම හා කෘෘරතම සතුරා බව බැල්දියෙස්ද සඳහන් කරයි.(බැල්දියෙස්ගේ ලංකා පුරාවෘත්තය,පි.37) දේශීය මූලාශ්‍ර සියල්ලම පාහේ පවසන කරුණුවලට වඩා හාත්පසින්ම වෙනස් කරුණක් හෝ කරුණු මෙසේ විදේශීය මූලාශ්‍ර අසත්‍යයැයි

බැහැර කිරිමද නොකළ යුතුය. එනමුත් රාජසිංහයන් පිළිබඳව ඔවුන් දක්වන යම් යම් තොරතුරු ගැන විමසිලිමත්ම විය යුතුය. මේ කෙසේ නමුත් රාජසිංහ පීතෘ ඝාතකයෙක් යැයි ක්වේරෝස්ද තම කෘතියේ කිසි විටෙක සඳහන් නොකරයි. එය සත්‍යක් නම් අනිවාර්යෙන්ම එය තමන්ගේ සතුරාට පහරක් ගැසීමට යොදා ගන්නවාමය. ක්‍රි.ව 1564 සැප්තැම්බර් 10 දින රාජසිංහ ප්‍රමුඛ සීතාවක සේනාව විසින් කොළඹ කොටුව වටලාගෙන සිටින අවස්ථාවේ රාජසිංහ විසින් පරංගීන් වෙත නියෝගයක් නිකුත් කරන්නේ දින 5ක් ඇතුළත තම පියාණන්ගේ නාමයට පරංගීන් යටත් විය යුතු බවක් සඳයන් කරමිනි. මේ ලියවිල්ල කොටුවේ පිටත බිත්ති වල එල්ලා දැනුම්දීම සිදු කරයි. එය ක්වේරෝස් දක්වන්නේ මෙසේය....the Portgusuese put writing on the doors in the name or the Raju saying in them that all those who freely choose to submit and trust to his word would have their lives and goods secured to them" and besides their own property others of greater value( that those who did not with in 5 days declare themselves lieges of Madune.(De Queyroz,1992,P.411)මෙයින් පැහැදිලි වන්නේ රාජසිංහ හට රාජධානියෙන් පිටතදී වුවත් කිසිඳු රාජ්‍ය ලෝභයක් නොමැති බවයි. ඒ සඳහා ඔහු හට පියා සමග ගැටලුක් ද නොවූ බවයි. එසේ නම් මහාවංසයේ දැක්වෙන පරිදි රාජ්‍යලෝභයෙන් පියා මැරීයයි යන චෝදනාවේ සත්‍යයක් තිබේදැයි ප්‍රශ්න කළ යුතුය.

මායාදුන්නේ රජු මහළු හෙයින් ක්‍රි. ව 1578 මැයි මාසයේදී රටවැසියාගේ පූර්ණ කැමැත්තෙන් සීතාවක හා කෝට්ටේ යන රාජ්‍යයද අගරජු යන නමද අත්හළ බව ක්වේරෝස්ම පවසයි.(De Queyroz,1992,P.323--.324-431) එසේම මායාදුන්නේ මිය යන්නේ ක්‍රි.ව 1581 දී බවද එහිම දක්වයි. ඒ දෙවන වර කොළඹ වැටලීම සිදුකරමින් සිටිනා අවස්ථාවේදීය. පෘතුගීසින්හට මෙතරම් බලපෑමක් පහරක් එල්ල කළ හා ඔවුන් හට මහත් වේදනාවක් දුන් රාජසිංහට පහරක් එල්ල කරන්නට හැක් වන්නේ කුමකින්ද එය සිදු කිරීම අනිවාර්යය. එහෙත් ක්වේරෝස් එවැන්නක්ද සඳහන් නොකරන්නේ ඔහු පීතෘ ඝාතකයෙක් නොවූ හෙයිනි. (De Queyroz,1992,P.438--) රාජසිංහයින් පීතෘ ඝාතකයෙක් වී නම් ඒ බව මේ යට කී රාජාවලිය අලකේශ්වර යුද්ධය සීතාවක හටන සැවුල් සංදේශය යන දේශිය මුලාශ්‍රය එකක හෝ දැක්විය යුතුය. නමුත් කිසිඳු විටෙක එවැන්නක් සඳහන් නොවේ. මෙසේම උඩරටට පක්ෂව ලියැවුණ අස්ගිරි තල්පත හෝ මන්දාරම් පුවතෙහිද එවැන්නක් සඳහන් නොවේ.

මේ පීතෘ ඝාතක චෝදනාවේ සත්‍යාසත්‍යතාවය පිළිබඳව මෙසේ තවත් ලෙසින් කරුණු දැක්විය හැක. ස්පිල්බර්ජන් නම් ඉංග්‍රීසි ජාතිකයාගේ වාර්ථාවට අනුව මේ පීතෘ ඝාතක කථාව උඩරටට පමණක් සීමා වූවකි. (ලංකා ඉතිහාසය,තුන්වන කොටස,2007පි,79)එසේ එක් ප්‍රදේශයක පමණක් එවැන්නක් ප්‍රචාරය වීමට හේතු වූයේ කවරක්දැයි ප්‍රශ්නයකි. යම් පුද්ගලයකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ හෝ බලපෑමක් අනුදැනුමක් මත සිදුවිනියයි සිතිම සාධාරණය. තවද සැවුල් සංදේසය ලිවීමේ අරමුණ වන්නේ පෘතුගීසින් හා සටන් වැදී සිටින රාජසිංහ රජුට ආරක්ෂාව ලබා දෙන මෙන් උපුල්වන් දෙවියන්ගෙන් කරන ඉල්ලීමක්ය. ඔහු පීතෘ ඝාතකයෙක් නම් ලාංකීය බෞද්ධ සම්ප්‍රධාය අනුවත් ලංකාව තුළ පීතෘ ඝාතකයන්ට ඇති තත්ත්වය අනුවත් රජුව ආරක්ෂා කරදෙන මෙන් දෙවියන්ගෙන් මෙසේ ඉල්ලීම් කරයිද යන්න සිතා බැලිය යුතුය. මෙසේම වර්තමානයේදී මේ රජු " ගනේගොඩ දෙයියෝ " යන නමින් ප්‍රාදේශියව ප්‍රසිද්ධියට පත්වී ඇත්තාසේම ඒ ඒ ප්‍රදේශවල ජනයාගේ වන්දනයට පාත්‍ර වී සිටිති. පීතෘ ඝාතක රජෙක් කිසි දිනෙක එවැනි උත්තරීතර තත්ත්වයකට පත් වේ යයි සිතිය නොහැක.

මෙහි ලා සඳහන් කළ යුතුම වන්නේ මහාවංසය පමණක් මෙසේ දක්වන්නේ මන්දැයි යන්නයි. මහාවංසයේ මේ කාලය පිළිබඳව විස්තරය ලියැවෙන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය කාලයේදී (ක්‍රි.ව 1700 පමණ) මල්වතු මහා විහාරයේ මහා නායක තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත හිමියන් විසිනි. (ලංකා ඉතිහාසය,තුන්වන කොටස,2007පි,79) උක්ත කී කුමන්ත්‍රණකාරී ක්‍රියා පටිපාටියේ ප්‍රතිඵලය ලෙසින් රජු පීතෘ ඝාතකයෙක් යැයි ඒ වන විටදී රටේ පැතිරී තිබූ මතය මේ හිමියන් තම කෘතියට එක් කරගත්තා විය හැකිය. එසේම මේ රජුට එරෙහිව ගෙනගිය කුමන්ත්‍රණය නිසා කු-මන්ත්‍රණකරුවන් සොයා දඬුවම් දීමටද රජු ක්‍රියා කළ නිසා රජු බොදු විරෝධීයාය ශාසන නාශකයාය යනුවෙන් ප්‍රචාරය වීමද පුදුමයට කරුණක් නොවේ. එවන් පසුබිමක් තුළ බෞද්ධ භික්ෂුන් වහන්සේ කෙනෙකු විසින් උක්ත කී අන්දමේ චෝදනාවක් ඇත්තෙකු පිළිබඳව විස්තරය තම කෘතියට එක් කිරීමද පුදුමයක් නොවේ. තවද මහාවංසය හැර උක්ත කී මූලාශ්‍රය වන රාජාවලිය අලකේශ්වර යුද්ධය පවා ඔහු පීතෘ ඝාතකයෙක් නොවන බව පවසයි.

පරණවිතාන මහතා සඳහන් කරන්නේ ලංකා ඉතිහාසය තුළදී සිංහල ජාතියත් ආගමත් නැත්තටම නැතිවී යන අවස්ථා තුනක් දැක ගත හැකි බවයි. පළමු වැන්න එළාරගේ පාලන අවධියත් පස්වන මිහිඳුගෙන් පසුව රට චෝල බලයට නතු වීමත්ය. ඉන් තෙවැන්න නම් රාජසිංහයින්ගේ මරණින් පසුව රටට අත්වූ ඉරණමයි. (සාහිත්‍ය,1964,පි11.13)ඉන් අදහස් වන්නේ රජු ජීවත්ව සිටි කාලයේදී රටට පිළිලයක්ව තිබූ පෘතුගීසින් මෙරටින් පන්නා දැමීමට කළ මහත් වූ වෙහෙස පිළිබඳවය. එහෙත් මහාවංසයේදී එවැනි කිසිඳු අන්දමේ තොරතුරක් හෝ නොදක්වා පීතෘ ඝාතක චෝදනාවක් පමණක් එල්ල කිරීම ගැටලු සහගත මෙන්ම අයුක්ති සහගත නොවේදැයි ප්‍රශ්නයක් මතුවේ.

මෙම කරුණු පිළිබඳව විමසීමේදී පෙනී යන්නේ සීතාවක රාජසිංහ රජුට එල්ල වී ඇති මේ පීතෘ ඝාතක චෝදනාව අසත්‍යයක් බවත් ඔහු හට තම පියා මැරීමට කිසිඳු අවශ්‍යතාවයක් නොවූ බවකි. මේ චෝදනාව එල්ල වන්නේ යම් යම් පාර්ශවයන්ගේ උවමනාවට බවත් එම පාර්ශවයන් විසින් පතල කල ඒ සාවද්‍ය ආරංචි හා තොරතුරු නිසා පසුකාලීන ලේඛකයෝද ඉතිහාසයමද වෙනත් දිශාවකට ගමන් ගත් බවක් පෙනේ. එසේම දෙස් විදෙස් රුපුන් මැද රට රැකීමට කුඩා කල සිටය තම දිවිය කැප කළ මේ රජු ලක්වී ඇත්තේ මහත් වූ අසාධාරණයකටමය. එසේම සීතාවක රාජධානියටත් එහි ආරම්භක පාලකයා වූ මායාදුන්නේ රජුටත් හිමිවී ඇති තැන සාධාරණ නොවේ.මෙහිදී මතුකරගත යුතු කරුණ වන්නේ රාජ්‍ය ද්‍රෝහී වූ පුද්ගලයින්ට රජු එරෙහි වූ බවක් හා ඔවුන්ට කිසිඳු සමාවක් නොදුන් බවකි. රජෙකු‍ගේ රාජ්‍ය පාලනයේ පරම යුතුකම හා වගකීම වන්නේ ද එයයි. නමුත් නිර්දෝෂී පුද්ගලයින්ට කිසිවිටෙක රජු බලපෑම් කළේ නැත. නමුත් සාවද්‍ය වූ කරුණු හේතුවෙන් උක්ත තත්ත්වය වෙනස් වී ඇත. එහෙයින් ඉතිහාස පර්යේෂකයාගේ වගකීම වන්නේ මෙවැනි ගැටලු සහගත තැන් සඳහා නිවැරදි පර්යේෂණයන් ලබා දීමය.

## <u>ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය</u>

### <u>ප්‍රාථමික මූලාශ්‍රය</u>

1. *අලකේශ්වර යුද්ධය,* (2009), සුරවීර, ඒ.වී, (සංස්.), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

2. *රාජාවලිය,* 1997), සුරවීර, ඒ.වී, (සංස්.), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

3. *සීතාවක හටන,* (1999), පරණවිතාන, රෝහිණී, (සංස්.), මධ්‍යම සංස්කෘතික අරමුදල,

1. De Queroz, Fernao, (1992), ***The Temporal and Spiritual Conquest of Ceylon Vol II***, Perera, F.S.G (Tr.) Asian Educational Services, New Delhi
2. Barows, Jao de and De Couto, Diogo De, (1943),
3. ***The History of Ceylon***, Fergoson, Donald, (Tr.), H.M.Richard Acting Government Printing, Colombo.

## පරිවර්තන

01.*බැල්දියස්ගේ ලංකාපුරාවෘත්තය,* ජයසේන,බී.එෆ්.ආර්.(පරි.),සූරිය ප්‍රකාශකයෝ,කොළඹ, 10.

## අමුද්‍රිත ලේඛන

01.*විත්තිපොත,* ශ්‍රී.ලං.රා.ලේ. 5/63/31/ (1)

## ද්විතියික මූලාශ්‍රය

1. අමරසිංහ, රිසිමන්, (1990), ***ඓතිහාසික සීතාවක,***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
2. අමරසිංහරිසිමන්, (1998), ***සීතාවකරාජධානියේඋන්නතියේ ද අවනතියේ ද සමහරඅංශපිළිබඳ විමර්ශනයක්***, කතෘ ප්‍රකාශන.
3. පීරිස්, පෝල් ඊ. (2008), ***ලංකාවපෘතුගීසි යුගය පළමුවනකාණ්ඩය***, (පරි.), හේවාවසම්, අභය,සූරියප්‍රකාශකයෝ, මරදාන.

## සඟරා

1. සාහිත්‍ය සඟරාව, 1964, තෙවන කලාපය, ශ්‍රී ලජකම සාහිත්‍ය මණ්ඩලය.